# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන පීඨය

### අධ්‍යාපනය පිළිබඳ දර්ශනශූරී උපාධිය (PhD) සහ අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය (MPhill) 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීමයි.

අධ්‍යාපනය පිළිබඳ දර්ශනශූරී උපාධිය (Ph.D) සහ අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය (M.Phill) සඳහා අයදුම්පත් **14/02/2021** සිට **14/03/2021** දක්වා නිකුත් කරනු ලැබේ.
මෙම වැඩසටහන පවත්වනු ලබන්නේ නාවල පිහිටි ප්‍රධාන විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේදී පමණි.

අධ්‍යයන මාධ්‍ය - මෙම වැඩසටහන ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

## ඇතුළත්වීමේ මූලික සුදුසුකම්

| අධ්‍යාපනය පිළිබඳ දර්ශනශූරී උපාධිය | අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය |
|---|---|
| අයදුම්කරුවන් පහත එක් සුදුසුකමක් හෝ සපුරා තිබිය යුතුය.<br><br>1. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව දර්ශනපති උපාධිය.<br>හෝ<br>2. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 9 වන මට්ටම හෝ ඊට ඉහල අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති උපාධිය (අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ සැළකිය යුතු පර්යේෂණ සංරචකයක් සහිත වීම වඩාත් සුදුසුය.)<br>හෝ<br>3. පරිමාණ 0-4 යට අනුව අවම වශයෙන් GPA අගය 3.00 සහිතව හෝ දෙවන පන්තිය පහළ අංශයේ සාමාර්ථයක් සහිතව අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල හයවන මට්ටමෙන් ප්‍රථම ගෞරව උපාධිය.<br>හෝ<br>4. සනාතන සභාව පිළිගනු ලබන සමාන හෝ උසස් සුදුසුකම්.<br>සහ<br>5. **අධ්‍යාපන පීඨය මගින් නියම කර ඇති අනෙකුත් සුවිශේෂී අවශ්‍යතාවන්.** | අයදුම්කරුවන් පහත එක් සුදුසුකමක් හෝ සපුරා තිබිය යුතුය.<br><br>1. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව SLQF 7 හෝ ඉහළ මට්ටමේ සුදුසුකම්.<br>හෝ<br>2. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් පාඨමාලා සම්මාන 30 සහිත SLQF 6 වන මට්ටමෙහි ප්‍රථම ගෞරව උපාධියක්.<br>හෝ<br>3. සනාතන සභාව පිළිගනු ලබන සමාන හෝ උසස් සුදුසුකම්.<br>සහ<br>4. **අධ්‍යාපන පීඨය මගින් නියම කර ඇති අනෙකුත් සුවිශේෂී අවශ්‍යතාවන්.** |

## අධ්‍යාපන පීඨය මගින් නියම කරනු ලබන සුවිශේෂී ඇතුළත්වීමේ සුදුසුකම්

- SLQF 9 හෝ ඉහළ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් තේරීම් ක්‍රියාවලියෙන් පසුව සලකා බලනු ලැබේ.
- එම වැඩසටහන සඳහා ලියාපදිංචි වීමට පෙර සියලුම අයදුම්කරුවන් විසින් අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය. ( සම්මාන 18ක පර්යේෂණ සංරචක සහිත දෙවර්ෂ ශාස්ත්‍රපති උපාධිය සහිත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

1 අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයක් උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත සහ ඉහළම අධ්‍යාපන සුදුසුකම්හි ඡායාපිටපත්,
2 පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ බව දැක්වෙන සහතිකයේ පිටපතක්,
3 අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියේ දැක්වෙන ආකෘතියට අනුව සකස් කළ විස්තරාත්මක පර්යේෂණ යෝජනාවලියක් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම් පත්‍රය** — අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය
**https://www.ou.ac.lk/programmes-faculty-of-edu/**

**යෝජනාවලිය සඳහා ආකෘතිය** — අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය:
**https://www.ou.ac.lk/programmes-faculty-of-edu/**

වැඩි විස්තර සඳහා සහකාර ලේඛකාධිකාරී (aredu@ou.ac.lk), අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.

ලේඛකාධිකාරී - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ.